**FOOD CONTROL ADMINISTRATION UNIT**
**Ministry of Health Nutrition & indigenous Medicine**
7th Floor, No, 464, T.B Jayah Mawatha, Colombo 10, Sri Lanka.
Telephone- +94 11 269 43 10 Fax- +94 11 269 43 11

මගේ අංකය :- PA/EOH/FCAU/63/2015

~~ඔක්තෝම්බර් 2018~~
16/නොවැම්බර්/2018

සියළුම පලාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,
සියළුම ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,
අධ්‍යක්ෂ, ජාතික සෞඛ්‍ය විද්‍යායතනය,
සියළුම මහනගර සහා ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්,
සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්,

<u>දුර ගමන් බස් රථ නවත්වනු ලබන හෝටල් / ආපන ශාලා වල ආහාර සෞඛ්‍ය නගා සිටුවීම.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් 2018 සැප්තැම්බර් 19 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී සාකච්ඡා කල අතර අදාල ව්‍යාපාරික ස්ථානවලින් වැඩි සංඛ්‍යාවක් මහජන සෞඛ්‍යයට තර්ජනයක් ඇතිවන අයුරින් පවත්වාගෙන යන බව සඳහන් කල අතර මෙම තත්වය යථාවත් කිරීම සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් වැඩපිලිවෙලක් යෙදිය යුතු බවට යෝජනා විය.

2011 ආහාර ස්වස්ථතා රෙගුලාසි වලට අනුකූලව මෙම ස්ථාන පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් මට්ටටින් බලයලත් නිලධාරීන් ගෙන් සැදුම් ලත් කණ්ඩායමක් පත්කර අවම වශයෙන් මසකට වරක්වත් මෙම ස්ථාන පරීක්ෂා කිරීම සඳහ වැඩපිළිවෙලක් යොදන ලෙස මෙයින් දන්වා සිටිමි. මේ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මාසික ප්‍රගති වාර්ථාවක් නැවත දැනුම්දෙන තුරු අඛන්ඩව සෑම මසකටම වරක් අධ්‍යක්ෂ පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය වෙත ලැබීමට සලස්වන මෙන් කරුණාවෙන් දන්වා සිටිමි.

අදාල පරීක්ෂණ කණ්ඩායම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, දිස්ත්‍රික් ආහාර හා ඖෂධ පරීක්ෂක, දිස්ත්‍රික් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක, අදාල ප්‍රදේශය භාර පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක හා කොට්ටාශය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂ යන නිලධාරීන්ගෙන් සමන්විත විය යුතු අතර අවශ්‍යතාවය මත වෙනත් සුදුසු නිලධාරියකුද පත්කර ගත හැකිය.

කොට්ටාශය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ මාසික ඉදිරි වැඩසටහනේ මෙම කටයුත්ත සඳහා දිනයක් වෙන්කල යුතු අතර මේ සඳහා ඔහුගේ නිරන්තර අධීක්ෂණය යොමු කරවිය යුතුය.

වෛද්‍ය අනිල් ජාසිංහ,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්,
(ප්‍රධාන ආහාර බලධාරියා).

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.